චක්‍රලේඛ අංක 24/2010

මගේ අංකය:ඩබ්/05/2010,
බන්ධනාගාර මූලස්ථානය.
බේස්ලයින් පාර.
කොළඹ -09.
2010.09.01

සියළුම අධිකාරින් /සහකාර අධිකාරීන් වෙත,

**සිරකරුවන් සඳහා පසුහාර කාරිත්ව ව්‍යාපතිය - නැගෙනහිර පලාත.**

අතිගරු ජනාධිපතිතුමාගේ ''මහින්ද චින්තන'' පිටු අංක 07 විනයගරුක සමාජයක් උදෙසා මතට තිත හා පිටු අංක 33 ''සිරගතවූ අය නිදහස් වන විට සමාජයට අනුගත කිරීමට නව වැඩ පිළිවලක් හදුන්වා දෙමි.'' යනවෙන් සඳහන් වේ. එම වැඩ පිළිවල යටතේ බන්ධනාගාර දෙපාර්තමෙන්තුව නිදහස් වන සිරකරුවන් සමාජ ගත කිරම සඳහා පවුල් සුභ සාධනය සහිතව පසුහාර වැඩ සටහනක් දිප ව්‍යාප්තව සංවිධානය කර තිබේ. එහි නියාමක ව්‍යාපෘතිය බස්නාහිර පලාත් සභාව එකාබද්ධව කොළඹ දිස්ත්‍රික්කය කෙන්ද්‍ර කරගෙන ආරම්භ කර ඇත. එම යෝජිත ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරි දායකත්වයන් ලබාගැනිමට බස්නාහිර පලාත් ප්‍රධාන ලේකම් විසින් අංක 01/01/ප්‍ර.ලී/පා/ආයතන හා 2007.02.22 වන දිනැතිව බස්නාහිර පලාත් සියලුම අමාත්‍යංශ ලේකම් වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරුන්,ප්‍රදේශිය ලේකම් වරුන්ට, සහ ජනාධිපති ලේකම්,ගරු ආණ්ඩුකාර තුමා (බස්නාහිර පලාත), ගරු ප්‍රධාන අමාත්‍යතුමා (බස්නාහිර පලාත), අධ්‍යක්ෂක, සමාජ සේවා දෙපාර්තමේන්තුව (බස්නාහිර පලාත), කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව (බස්නාහිර පලාත), සමගින් මටද පිටපතක් සහිතව නිකුත් කර ඇති 01/2007 පාලන චක්‍රලේඛය හා සම්බන්ධව, එම චක්‍රලේඛයේ පිටපතක් අමුණා ඇත.

''සිරකරුවන්ගේ පවුල් සුභ සාධනය සහිත පසු භාර වැඩ සටහන'' ක්‍රියාත්මක කිරිමේදි ප්‍රදේශිය ලේකම් වරුන්ගේ ප්‍රධානත්වයෙන් පොලිසිය,බන්ධනාගාරය,ආගමික සංවිධාන හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන එක්ව පසුහාර කමිටු ස්ථාපනය කෙරේ.

නැගෙනහිර පලාතේ දියත් කරන පසුහාර වැඩසටහන යටතේ සුභ සාධන කටයුතු සඳහා අවශ්‍ය වන උපකාරක සේවාවන් පලාත් සභාවේ,සෞඛ්‍ය අමාත්‍යංශය,අධ්‍යාපන අමාත්‍යංශය,සමාජ සේවා දෙපාර්තමේන්තුව,පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව,ඇතුළු පලාත් සභා අමාත්‍යංශය /දෙපාර්තමේන්තු/ආයතන විසින් සපයනු ලැබේ

එබැවින් මෙම වැඩ පිළිවල ක්‍රියාත්මක කිරිමට පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

01. මඩකලපුව දිස්ත්‍රික්කයේ පදිංචි මාස 06 ට වැඩි සිරදඬුවම් ලබා බන්ධනාගාර ගතවූ වන්ගේ තොරතුරු බන්ධනාගාර ගතවූ අවස්ථාවේ දිම සපයනු ලබන පත්‍රිකාව මගින් ලබාගෙන නැගෙනහිර පලාත් සභාවේ නියොජ්‍ය ප්‍රධාන ලේකම් වෙතද,අදාල ප්‍රදේශිය ලේකම් වෙත ද, අනෙක් පිටපත බන්ධනාගාර කොමසාරිස් (සුභ සාධක) වෙත ද,එලෙබෙන **සෑම මසකම 10 ව දිනට පෙර එවීමට කටයුතු කල යුතුය.**

02. මෙම ව්‍යාපෘතියට ගැනෙන සිරකරුවන් /සිරකාරියන් පිළිබඳව **නිදහස් වීමට මාස 03 කට පෙර සපයන ලද ආකෘතිය අනුව ලබාගන්නා තොරතුරු** නැගෙනහිර පලාත් සභාවේ නියොජ්‍ය ප්‍රධාන ලේකම් වෙතද,අදාල ප්‍රදේශිය ලේකම් වෙත ද, අනෙක් පිටපත බන්ධනාගාර කොමසාරිස් (සුභ සාධක) වෙත ද, **ප්‍රමාදයකින් තොරව එවීමට කටයුතු කලයුතුය.**

03.සිරකරු බන්ධනාගාර ගත වී පවුල් සුභ සාධන කටයුතු ඇරඹීමෙන් මාස 03 කට පසු ඔහු/ඇය නිදහස් වි පසු භාර ව්‍යාපෘතියට අනුගත වීමෙන් මාස 03 ට පසුව ප්‍රගති වාර්ථා බන්ධනාගාර කොමසාරිස් (සුභ සාධක) වෙත එවීමට සුභ සාධක නිලධාරි කටයුතු කල යුතුය.

04.මෙම වැඩ පිළිවෙල 2010.08.01 ව දින සිට ආරම්භ කලයුතු අතර ක්‍රියාවලියේ ප්‍රගතිය මාස 03කට පසුව සමාලෝචනයකරන අතර ඊට අදාල නියෝග මාවිසින් පසුව නිකුත් කරණු ලැබේ.

නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම් ගේ එකගත්වය මත මෙම චක්‍රලේකය නිකුත් කරණු ලැබේ.

වි.ආර්.සිල්වා ආර්එස්පී, යූඑස්පී, එන්ඩියු, අයිපි
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත:

01. ගරු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යයතුමා
02. ජනාධිපති ලේකම්.
03. ගරු ආණ්ඩුකාරතුමා.
04. ගරු ප්‍රධාන අමාත්‍යතුමා. - නැගෙනහිර පලාත.
05. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය
06. ප්‍රධාන ලේකම්, නැගෙනහිර පලාත.
07. අධ්‍යක්ෂක සමාජ සේවා දෙපාර්තමේන්තුව, නැගෙනහිර පලාත.
08. කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව, නැගෙනහිර පලාත.
09. දිස්ත්‍රික් ලේකම්.
10. සියළුම ප්‍රදේශිය ලේකම් වරුන්.

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
" சிராவஸ்தி மந்திரய", 32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல / My No } 1/1/පුනි/පා/ආයතන

ඔබේ අංකය / உமது இல / Your No. } චක්‍රලේඛ/2007

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary

දුරකථන / தொலைபேசி / Telephone } 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2694667

පොදු / பொது / General

දුරකථන / தொலைபேசி / Telephone } 2691885,2682868 2696027,2682869 2682870

දිනය / திகதி / Date } 2007.02. 22


*පාලන චක්‍රලේඛ 01/2007*

බස්නාහිර පළාතේ සියළුම
අමාත්‍යංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
බස්නාහිර පළාතේ
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>සිරකරුවන් සඳහා පසුභාරකාරීත්ව ව්‍යාපෘතිය - බස්නාහිර පළාත</u>

අතිගරු ජනාධිපතිතුමාගේ 'මහින්ද චින්තන' ප්‍රකාශනයට අනුව සිරගතව සිට නිදහස් වන පුද්ගලයින් නැවත සමාජයට අනුගත කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් වැඩ පිළිවෙල සඳහා ඔබගේ ක්‍රියාකාරී දායකත්වය ලබා දීම අපේක්ෂා කරමි.

I. බන්ධනාගාරගතව සිට නිදහස් වී පැමිණෙන පුද්ගලයින්ට සමාජයේ පිළිගැනීමක් ඇතිව, ඔවුන් බන්ධනාගාරයේ දී විවිධ අංශවලින් ලබාගත් පුහුණුවීම් උපයෝගි කොට ගෙන නැවත වැරදිවලට නොපෙළඹවී සාධාරණ ජීවිතයක් ගත කිරීමට සුදුසු වාතාවරණය සකස්කිරීම සඳහා අවශ්‍ය සමාජමය උපකාරීත්වය සහ අනුබලය ලබා දීම

II. බන්ධනාගාරගතව සිට නිදහස්වන්නන් නැවත සමාජගත කිරීමට ක්‍රමවත් පසුභාරකාරීත්ව සේවාවක් ඇති කිරීම

III. යම් පුද්ගලයෙකු බන්ධනාගාරගත කළ දිනයේ සිට ඔහු/ඇය නැවත සිර දඬුවම් නිමව පැමිණෙන තුරු සහ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත වූවන්ගේ පවුල්වල ශුභසාධන කටයුතු ඉටු කිරීම

IV. එම බන්ධනාගාර නේවාසිකයින්ගේ දූ-දරුවන්ගේ අධ්‍යාපන, ආර්ථික සමාජයිය හා ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා අවශ්‍ය කටයුතු කිරීම


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிருவாகம் / Administration | පිරිස් / පුහුණු / ஆளணியும் / பயிற்சி / Personal & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering |
|---|---|---|---|---|---|
| | Tel: 2693964 Fax: 2693964 | Tel: 2693962 Fax: 2693962 | Tel: 2693978 Fax: 2673968 | Tel: 2693970 Fax: 2675280 | Tel: 2693968 Fax: 2689900 |

02. බන්ධනාගාර ගත වුවන් පිළිබඳ හා ඔහුගේ/ඇයගේ පවුලේ තොරතුරු පුද්ගලයෙකු බන්ධනාගාරගත වූ අවස්ථාවේදීමත්, සිරෙන් නිදහස් වීමට මාස 03 කට පෙර, ඒ පිළිබඳ තොරතුරුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සපයනු ඇත.

03. ඉහත වැඩ පිළිවෙල යටතේ සුභ සාධන කටයුතු සඳහා අවශ්‍ය උපකාරක සේවාවන් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යංශය, අධ්‍යාපන අමාත්‍යංශය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු පළාත් සභා අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු/ආයතන විසින් සැළැස්වීමට කටයුතු යෙදිය යුතුය.

04. සිරකරුවන්ගේ පශ්චාත්කාරීත්ව සේවාවන් සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් පොලිසිය, බන්ධනාගාරය සහ අනිකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව කමිටු ස්ථාපිත කළ යුතුය.

05. ඉහත වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන්, ස්වේච්ඡා සංගම්, ආගමික පූජකවරුන්ගේ සහාය ද ලබාගෙන, විධිමත් වැඩ සටහන් සකස් කර, සක්‍රියව ක්‍රියාත්මක කළ යුතුය.

06. මෙම වැඩ පිළිවෙල් පළමු පියවර වශයෙන් නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ පළමුව ක්‍රියාත්මක කිරීමටත් අනතුරුව බස්නාහිර පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පුළුල්ව ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය. ඒ අනුව ඉහත සත්කාර්යය ඉටු කිරීම සඳහා ඔබ යටතේ සේවය කරන නිලධාරීන් දැනුවත් කොට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොපමාව ක්‍රියාත්මක කළ යුතුය.

07. මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය මාස 03 කට පසුව සමාලෝචනය කරනු ලැබේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ එකඟත්වය මත මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලදි.

ඩබ්.එම්.ආර්.බී.වන්නිනායක
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. ගරු ආණ්ඩුකාරතුමා - බස්නාහිර පළාත
3. ගරු ප්‍රධාන අමාත්‍යතුමා - බස්නාහිර පළාත
4. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
5. අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත
6. කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත
7. දිස්ත්‍රික් ලේකම් (කොළඹ/ගම්පහ/කළුතර)